(ට) ලංකාවේ පදිංචිය ඇති මුස්ලිම් ස්ත්‍රියක සමග ලංකාවේ පදිංචිය නැති මුස්ලිම් පුරුෂයෙකු සිදුකරගන්නාවූද විවාහයක් ලියා පදිංචි කිරීමේදී එම විවාහය යටත්විය යුතු නියම. එම නියම කරගත යුත්තේ මහාරය කලින් ගෙවීම සඳහා හා විවාහයෙන් ලැබිය හැකි යම්කිසි දරුවෙකු නඩත්තු කිරීමට මුදල් තැන්පත්කිරීම සඳහාත් විය යුතුය.

(ඩ) මෙම පනතින් නියමකරන ලෙස අවශ්‍යවන නැතහොත් බල කරනු ලබන අනිකුත් සියලු කටයුතු හෝ මෙම පනතෙහි විධිවිධාන ක්‍රියාවෙහි යෙදීම පිණිස ඇමතිවරයාට අවශ්‍ය ලෙස නැතහොත් යොග්‍ය ලෙස පෙනී යා හැකි අනිකුත් කරුණුද වේ.

(2) පළමුවෙනි උප ලේඛනයේ පෙනෙන යම්කිසි ආකෘතියක්ද දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි හෝ පස්වෙනි උප ලේඛනයක සඳහන් ව්‍යවස්ථාවක්ද අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ නැතහොත් එබන්දක් වෙනුවට අන් කිසිවක් යෙදීමට හෝ මෙම වගන්තිය යටතේ සාදනලද නියෝගය කින් පිළිවන. තවද යම්කිසි උප ලේඛනයක් එක් කිරීම හෝ නැත හොත් මෙහි අඩංගු උප ලේඛනයක් වෙනුවට වෙන උප ලේඛනයක් යෙදීම හෝ එසේම කළ හැකිය.

(3) මෙම වගන්තිය යටතේ ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලබන සෑම නියෝගයක්ම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂා තුනෙන්ම ගැසට් පත්‍රයෙහි පළකළ යුතුයි. උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මතකරන තෙක්ද, ඊට පසු එසේ සම්මත කළ බැව් ගැසට් පත්‍රයෙහි නිවේදනය කින් පළ කරනතෙක්ද නියෝගයක් වලංගු නොවන්නේය.

සිවිල් අධිකරණවල නඩු පැවරීම මෙයින් අත් හැරීම.

**95.** විවාහක පුරුෂයෙකුගේ හෝ ස්ත්‍රියකගේ විවාහය පිළිබඳ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඔහුට හෝ ඇට සිදුවී තිබෙණ අලාභ යක් අයකරගැනීම පිණිස වෙන කෙනෙකුට විරුඬව ඔහු හෝ ඇය විසින් සිවිල් අධිකරණයක නඩුවක් පැවරීමේදී මෙම පනතේ සඳහන් කිසිවකින් එම නඩුව වැළැක්විය හැකි ලෙස තේරුම් නොගත යුතුය.

දිස්ත්‍රික් ලේකම් කෙනෙකු ගැන සඳහන් කිරීම තේරුම් ගැනීම.

**96.** මෙම පනතෙහි හෝ එය යටතේ සම්පාදිත නියෝගයක හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකුට යම් සඳහන් කිරීමක් තිබේනම් එය, 10වෙනි වගන්තිය යටතේ පත්කරන ලද විශෙෂ ලේකම් කෙනෙකුටද නැතහොත් 14වෙනි වගන්තිය යටතේ පත්කරනලද විශෙෂ ක්වාසිකෙනෙකුට ද, මෙම පනත හෝ එකී නියෝගයක් හෝ අදාළකිරීම පිණිස සඳහන් කිරීමේදී "දිස්ත්‍රික් ලේකම්" යන වචන වෙනුවට "රෙජිස්ට්‍රාර් ජනරාල්" යන්න යෙදුවාක් මෙන් කියවා තේරුම්ගත යුතුය.

පද සංසන්දනයේදී අන් අදහසක් අනවශ්‍යවූ විට මෙම පදවල ගනී පහත සඳහන් පාඨවල අර්ථය ඒ අනුව සඳහන් කරනු පරිදි වන්නේය.

ස්ත්‍රික්කය" යනුවෙන් ආදායම් දිස්ත්‍රික්කයක් අදහස් කරයි.

ස්ත්‍රික් ලේකම්"; යම් දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් යන්නෙහි තේරුම නම් විවාහ ලියා පදිංචි කිරීමේ පනත සඳහා එම දිස්ත්‍රික්කයේ විවාහ පිළිබඳව දිස්ත්‍රික් ලේකම් වශයෙන් හෝ එම ධුරයෙහි වැඩ බැලීමට හෝ පත්කරනු ලැබූ තැනැත්තාය. තවද එම දිස්ත්‍රික්කයේ අතිරේක දිස්ත්‍රික් ලේකම් කෙනෙකු මෙන්ද එබඳු ධුරයක වැඩ බැලීමට ද පත්කරනු ලැබූ තැනැත්තෙක්ද මීට ඇතුළත්ය.

දෙවෙනි පිටපත"; මෙම පනත යටතේ යම්කිසි ලේකම් පොතක මුල් පත්‍ර උප පත්‍ර වශයෙන් ඇතුළත් කරනලද යම්කිසි විස්තර සටහනක් සම්බන්ධයෙන් "දෙවෙනි පිටපත" යන්නෙහි තේරුම නම්, මෙම පනතෙහි සඳහන්කර තිබෙණ අන්දමට මෙම ලේකම් පොතින් ඉරා වෙන්කොට පාවිච්චි කිරීම සඳහා අදහස් කරනලද මුල් පත්‍රයයි.

කයිකූලි"; විවාහයට ප්‍රථම හෝ විවාහය සිදුකරන වේලාවෙහිදී හෝ මනාලියගේ ඥාතියෙකු විසින් නැතහොත් යම් කෙනෙකු විසින් මනාලියගේ ප්‍රයෝජනය සඳහා මනාලයාට දුන්නාවූ නැතහොත් දීමට පොරොන්දුවූ යම් කිසි මුදලක් නොහොත් චංචල දේපලක් "කයිකූලි" යන්නෙන් අදහස් කරයි.

නියමිත" යන්නෙහි තේරුම නම් මෙම පනත යටතේ සාදනලද නියෝගවලින් නියම කිරීමයි.

ක්වාසි" යන්නෙහි තේරුම නම් 12වෙනි හෝ 13වෙනි හෝ 14වෙනි හෝ වගන්තියක් යටතේ පත්කරනු ලැබූ ක්වාසි කෙනෙකි.

ලේකම්" යන්නෙහි තේරුම නම් මෙම පනත යටතේ විවාහ ලියා පදිංචි කිරීම පිණිස 8වෙනි හෝ 9වෙනි හෝ 10වෙනි හෝ වගන්තියක් යටතේ පත්කරනු ලැබූ ලේකම් කෙනෙකි.

'රිජිස්ත්‍රාර් ජනරාල්" යන්නෙහි තේරුම නම් විවාහ ලියා පදිංචි කිරීමේ පනතෙහි 2වෙනි වගන්තිය යටතේ රිජිස්ත්‍රාර් ජනරාල්තැන වශයෙන් හෝ එම ධුරයෙහි වැඩ බැලීම පිණිස හෝ පත්කරනු ලැබූ තැනැත්තෙකි. උප රිජිස්ත්‍රාර් ජනරාල් කෙනෙක්ද මීට ඇතුළත්ය.

"නියෝගය" යන්නෙහි තේරුම නම් මෙම පනත යටතේ සාදන ලද නියෝගයකි.

"ක්වාසි මණ්ඩලයෙහි ලේකම්" යන්නෙහි තේරුම නම් 15වෙනි වගන්තියේ (6) වෙනි උප වගන්තිය යටතේ පත්කරනු ලැබූ ලේකම් කෙනෙකි.

## XIIවෙනි කාණ්ඩය

### අවලංගුකිරීම, අත්හැරීම් හා අස්ථිර විධිවිධාන

අවලංගු කිරීම.

98. 99වෙනි පරිච්ඡේදය වන මුස්ලිම් විවාහ හා දික්කසාද ලියාපදිංචිකිරීමේ ආඥා පනත මෙයින් අවලංගුකරනු ලැබේ.

විවාහ හා දික්කසාද පිළිබඳ මුස්ලිම් නීතිය ආරක්ෂා කරගැනීම.

99. (1) 1806යේ මහමදගම්කාරයින්ගේ නීති සංග්‍රහයේ 64වෙනි වගන්තියේ සිට 101වෙනි වගන්තිය දක්වාද, 102වෙනි වගන්තියේ පළමුවෙනි ඡේදයද, 1929යේ මුස්ලිම් විවාහ සහ දික්කසාද ලියා පදිංචිකිරීමේ පනතින් අවලංගුකිරීම, නැතහොත් මෙම පනතින් එම පනත අවලංගුකිරීම, විවාහ හා දික්කසාද පිළිබඳ මුස්ලිම් නීතියටද මුස්ලිම්වරුන්ට එය යටතේ අයිතිව තිබෙණ බලතලවලටද හානියක් නොවන්නේය. ඇතිවියහැකි සැක දුරුකිරීම පිණිස මෙම ප්‍රකාශය මෙයින් කරනු ලැබේ.

(2) යම්කිසි මුස්ලිම් විවාහයක් හෝ දික්කසාදයක් පිළිබඳ සියලු කරුණුවලදී පාර්ශවකාරයින්ගේ තත්ත්වය හා අන්‍යොන්‍ය අයිතිවාසිකම් හා වගකීම්ද එකී පාර්ශවකාරයින් අයත් නිකාය පාලනයකරන නීතිය අනුව තීරණය කරගත යුතු බව වැඩිදුරටත් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අත්හැරීම්.

100. (1) මෙම වගන්තියෙහි—

(අ) "නියමිත දිනය" යන්නෙහි අදහස නම් මෙම පනතෙහි 1වෙනි වගන්තිය යටතේ ආඥාවකින් නියමකරනලද දිනයයි.

(ආ) "අවලංගුකරනු ලැබූ පනත" යන්නෙහි අදහස නම් 98වෙනි වගන්තියෙන් අවලංගු කරනු ලැබූ පනතයි.

(2) නියමිත දිනයේදී සහ පසුව—

(අ) අවලංගු කරනු ලැබූ පනතේ 18වෙනි වගන්තිය යටතේ සම්පාදිතව නියමිත දිනයට ප්‍රථම දිනයෙහි වලංගුව තිබුණ සෑම නීතියක්ද, 22වෙනි වගන්තිය යටතේ සම්පාදිතව එසේම වලංගුව තිබුණ සෑම නියෝගයක්ද මෙම පනතෙහි විධිවිධානවලට විරුඬ නොවේ නම් එකී නීතිය මෙම පනතෙහි 62වෙනි වගන්තිය යටතේද, එකී නියෝගය මෙහි 94වෙනි වගන්තිය යටතේද වූවක් ලෙස වලංගුවිය යුතුවත් හැර, එය එසේම සැලකිය යුතුය.

(ආ) අවලංගුකරනලද පනත යටතේ බලය ලැබ ධුරයේ කටයුතු, කරන්නාවූ සෑම පූජක කෙනෙක් හෝ තාවකාලික පූජක කෙනෙක් හෝ විශෙෂ පූජක කෙනෙක් හෝ මෙම පනත යටතේ පත්කරනුලැබූ ලේකම් කෙනෙක්, තාවකාලික ලේකම් කෙනෙකු නැතහොත් විශෙෂ ලේකම් කෙනෙකු

ලෙස සැලකිය යුතුය. අවලංගු කරනලද පනත යටතේ නිකුත්කරනලද සෑම බලපත්‍රයක්ද, මෙම පනත යටතේ නිකුත්කරනලද අක්තයක් ලෙස සැලකිය යුතුය.

(ඉ) අවලංගුකරනලද පනත යටතේ පත්කරනලද සෑම කාතිකෙනෙක් හෝ තාවකාලික කාති කෙනෙක් හෝ විශෙෂ කාති කෙනෙක්, මෙම පනත යටතේ පත්කරනලද ක්වාසි කෙනෙකු, තාවකාලික ක්වාසි කෙනෙකු නැතහොත් විශෙෂ ක්වාසි කෙනෙකු ලෙස සැලකිය යුතුය. අවලංගු කරනලද පනත යටතේ පත්කරනලද කාති මණ්ඩලයද මෙම පනත යටතේ පත්කරනලද ක්වාසි මණ්ඩලය ලෙස සැලකිය යුතුය.

(ඊ) අවලංගුකරනලද පනත යටතේ ආරම්භකොට නියමිත දිනයට ප්‍රථම දිනයේදී විභාග වෙමින් හෝ අසම්පූර්ණව හෝ තිබුණ සෑම විභාගයක්, ඇපෑලක් නැතහොත් අනිකුදු නීති කෘත්‍යයක් එම දිනයේදි සහ ඊට පසුව හැකි තරම් දුරට මෙම පනත යටතේ විධිවිධාන අනුව ගෙනයා යුතුය ; නැත හොත් සම්පූර්ණකළ යුතුය.

(උ) අවලංගුකරනලද පනතෙහි 33වෙනි වගන්තිය යටතේ කාතිවරුන්ට හා ධුරයේ කටයුතු කරන පූජකවරුන්ටත් නිකුත් කරනුලැබ එදිනට ප්‍රථම දිනයේදී පාවිච්චිකරමින් තිබුණ සියලුම ලේකම් පොත් සහ අනිකුදු පොත් එම දිනයේදී හා ඊට පසුව මෙම පනතින් සහ එය යටතේද නියමකරනලද අන්දම සහ ආකෘතිය අනුව වූවක් මෙන් සලකනු ලැබේ. තවද රිජිස්ත්‍රාර් ජනරාල් හෝ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු හෝ අන් අන්දමක නියෝගයක් කළහොත් විනා එකී පොත් ඒවා සම්පූර්ණවන තෙක් මෙම පනතේ කරුණු සඳහා අවශ්‍යවන සුළු වෙනස්කම් සහිතව පාවිච්චි කළ යුතුය.

(ඌ) අවලංගුකරනලද පනත අනුව ප්‍රොවින්ෂල් රෙජිස්ත්‍රාර් විසින් හෝ ඔහු ඉදිරියේදී හෝ නැතහොත් උප ප්‍රොවින්ෂල් රෙජිස්ත්‍රාර් විසින් හෝ ඔහු ඉදිරියේ හෝ කළයුතු යම් කිසිවක් එදිනට ප්‍රථම දිනයේදී විභාග වෙමින් තිබෙණ විට නැතහොත් අසම්පූර්ණව තිබෙණ විට එය මෙම පනත යටතේ දිස්ත්‍රික් ලේකම් කෙනෙකු විසින් හෝ ඔහු ඉදිරියේදී හෝ විභාගකොට සම්පූර්ණ කළ හැකිය.

(එ) අවලංගුකරනලද පනතින් ප්‍රොවින්ෂල් රෙජිස්ත්‍රාර්තැනට හෝ උප ප්‍රොවින්ෂල් රෙජිස්ත්‍රාර්තැනට යැවිය යුතු යම්කිසි ඉල්ලීමක්, ප්‍රකාශයක් නැතහොත් අන්කිසි ලේඛනයක් නියමිත දිනට ප්‍රථම එසේ යවා නොමැති විට, එම දිනයේදී හෝ ඊට පසුව මෙම පනත අනුව එය දිස්ත්‍රික් ලේකම් තැනට යැවිය හැකිය.

**පළමුවෙනි උපලේඛනය**

1වෙනි ආකෘති පත්‍රය

(8වෙනි වගන්තිය)

**විවාහ ලියා පදිංචිකිරීම සඳහා, මුස්ලිම් විවාහ ලේකම් කෙනෙකු පත්කිරීමේ අක්තය**

උප පත්‍රය

අංකය :—³.

———— වන මම මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 8වෙනි වගන්තිය අනුව මා වෙත පැවරී තිබෙණ බලතල අනුව ———— ප්‍රදේශයෙහි විවාහ ලේකම් ධුරයට ———— පදිංචි ———— නමැත්තා මෙයින් පත්කරමි.

අත්සන්කළේ :————
රිජිස්ට්‍රාර් ජනරාල්.

දිනය :————

මුද්දරය.

---

මුල් පත්‍රය

අංකය :—³.

———— වන මම මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 8වෙනි වගන්තිය අනුව මා වෙත පැවරී තිබෙණ බලතල අනුව ———— ප්‍රදේශයෙහි විවාහ ලේකම් ධුරයට ———— පදිංචි ———— නමැත්තා මෙයින් පත්කරමි.

අත්සන්කළේ :————
රිජිස්ට්‍රාර් ජනරාල්.

දිනය :————

මුද්දරය.

## 2වෙනි ආකෘති පත්‍රය

(18 (1) වගන්තිය).

### මුස්ලිම් විවාහ හා දික්කසාද පනත

18 (1) වගන්තිය යටතේ මනාලයෙකු විසින් කරනු ලබන ප්‍රකාශයක ආකෘතිය

මෙහි පහත අත්සන්කරන ———— වන මම, මා සහ ———— අතරේ විවාහයක් සිදුකරන/සිදුකර තිබෙණ/බව මෙයින් දැනුම් දෙමි. තවද මෙහි පහත ඇතුළත්කර තිබෙන කරුණු මගේ දැනගැන්මේ සහ විශ්වාසයේ අන්දමට සත්‍යවූත්, නිවැරදිවූත් කරුණු බවද එකී විවාහයට නීත්‍යනුකූල බාධාවක් නොමැති බවද ගම්භීරතාපූර්වකව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

1. මනාලයාගේ සම්පූර්ණ නම :————.
2. මනාලයාගේ වයස :————.
3. මනාලයාගේ පදිංචිය :————.
4. මනාලයාට ආරක්ෂකයෙකු සිටිනම් ඔහුගේ සම්පූර්ණ නම : ————.
5. මනාලියගේ සම්පූර්ණ නම :————.
6. මනාලියගේ වයස :————.
7. මනාලියගේ පදිංචිය :————.

*8. මනාලියගේ "වාලි" ගේ සම්පූර්ණ නම :————.

9. මනාලිය හා "වාලි" අතර ඇති ඥාති සම්බන්ධය (පියා, පිය පක්ෂයේ මුත්තා, සහෝදරයා යනාදිය) :————.
10. මනාලයා මීට ප්‍රථමද විවාහවූවෙක්ද යන්න, එසේනම් කවරෙකුටද :————.
11. කලින් විවාහවූ භායර්‍යාව නොහොත් භායර්‍යාවන්, දික්කසාද කරන ලද්දේද, නොහොත් නැසීගියේද යන්න :————.
12. දික්කසාද කරනලද්දේ නම් දික්කසාදය ලියා පදිංචිකරන ලද දිනය සහ අංකය සහ ධුරයෙහි ක්‍රියාකළ පූජකතැනගේ නොහොත් ක්වාසිතැනගේ නම, ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය :————.

අත්සන්කළේ :————.
මනාලයාගේ අත්සන.

19——ක්වූ ———— මස ———— දින මා ඉදිරියේ අත්සන් කරන ලදී.

අත්සන්කළේ :————.
———— දිස්ත්‍රික්කයේ ———— ප්‍රදේශය පිළිබඳ
මුස්ලිම් විවාහ ලේකම්.

---

* 47වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ විවාහයක් සිදු කිරීමට ක්වාසිතැන විසින් විශෙෂයෙන් බලය දුන් විටද නැතහොත් මනාලිය අයිති නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය අනුව "වාලි" කෙනෙකු අනවශ්‍ය විට ද මෙය අත්හැරීමට පිළිවන.

3වෙනි ආකෘති පත්‍රය

(18 (1) වගන්තිය).

## මුස්ලිම් විවාහ හා දික්කසාද පනත

18 (1) වගන්තිය යටතේ මනාලියගේ "වාලි" විසින් කරනු ලබන ප්‍රකාශයේ ආකෘතිය.

මෙහි පහත අත්සන්කරන ——— මනාලියගේ "වාලි" වන මම ——— හා ——— අතර විවාහයක් සිදුකරන/සිදුකර තිබෙණ බව මෙයින් දැනුම් දෙමි. තවද මෙහි පහත ඇතුලත්කර තිබෙණ කරුණු මගේ දැනගැන්මේ සහ විශ්වාසයේ අන්දමට සත්‍යවූත්, නිවැරදිවූත් කරුණු බවද එකී විවාහයට නීත්‍යනුකූල බාධාවක් නොමැති බවද ගම්භීරතාපූර්වකව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

1. මනාලයාගේ සම්පූර්ණ නම :———.
2. මනාලයාගේ වයස :———.
3. මනාලයාගේ පදිංචිය :———.
4. මනාලයාට ආරක්ෂකයෙකු සිටිනම් ඔහුගේ සම්පූර්ණ නම: ———.
5. මනාලියගේ සම්පූර්ණ නම :———.
6. මනාලියගේ වයස :———.
7. මනාලියගේ පදිංචිය :———.
8. මනාලිය මීට ප්‍රථම විවාහවූ ස්ත්‍රියක්ද යන්න :———.
9. විවාහවූ ස්ත්‍රියක නම් කවරෙකු හටද :———.
10. මනාලිය කලින් විවාහවූ පුරුෂයා නැසී ගොස් ද නැත්නම් දික්කසාද කරන ලද්දේද:———.
11. දික්කසාද කරනලද්දේ නම් දික්කසාද ලියා පදිංචිකරන ලද දිනය සහ අංකය සහ ධුරයෙහි ක්‍රියාකළ පූජකතැනගේ නොහොත් ක්වාසිතැනගේ නම, ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය :———.

අත්සන්කළේ :———.
"වාලි"ගේ අත්සන.

"වාලි"ගේ පදිංචිය :———.

මෙහි පහත අත්සන්කරන ——— වන මම, මගේ පියා හෝ පිය පක්ෂයේ මුත්තා හෝ නොවන "වාලි" විසින් කරනලද ඉහත දක්වෙන ප්‍රකාශයෙහි සත්‍යතාව මෙයින් සථිරකරමි.

අත්සන්කළේ :———.
මනාලියගේ අත්සන.

19——ක්වූ ——— මස ——— දින මා ඉදිරියේදී අත්සන් කරන ලදී.

අත්සන්කළේ :———.
——— දිස්ත්‍රික්කයේ ——— ප්‍රදේශයේ
මුස්ලිම් විවාහ ලේකම්.

**IVවෙනි ආකෘති පත්‍රය.** (18 (2) වගන්තිය).

අංකය :————.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත
මුස්ලිම් විවාහ ලේකම් පොත

දිස්ත්‍රික්කය :————.

ලේකම්ගේ ප්‍රදේශය :————.

විවාහය ලියා පදිංචිකරන ලේකම්ගේ සම්පූර්ණ නම :—

| | මනාලයා | මනාලිය |
|---|---|---|
| 1. සම්පූර්ණ නම .. | | |
| 2. වයස .. | | |
| 3. සිවිල් තත්වය .. | | |
| 4. දික්කසාදකරනලද නම් ඒ පිළිබඳව සාක්ෂි ඇතොත් ඒවා | | |
| 5. පදිංචිය .. | | |
| 6. පියාගේ හෝ අන්‍ය ආරක්ෂකයාගේ සම්පූර්ණ නම .. | | |
| 7. ආරක්ෂකකමේ අන්දම .. | | |

**IVවෙනි ආකෘති පත්‍රය.** (18 (2) වගන්තිය).

අංකය :————.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත
මුස්ලිම් විවාහ ලේකම් පොත

දිස්ත්‍රික්කය :————.

ලේකම්ගේ ප්‍රදේශය :————.

විවාහය ලියා පදිංචිකරන ලේකම්ගේ සම්පූර්ණ නම :—.

| | මනාලයා | මනාලිය |
|---|---|---|
| 1. සම්පූර්ණ නම .. | | |
| 2. වයස .. | | |
| 3. සිවිල් තත්වය .. | | |
| 4. දික්කසාදකරනලද නම් ඒ පිළිබඳව සාක්ෂි ඇතොත් ඒවා | | |
| 5. පදිංචිය .. | | |
| 6. පියාගේ හෝ අන්‍ය ආරක්ෂකයාගේ සම්පූර්ණ නම .. | | |
| 7. ආරක්ෂකකමේ අන්දම .. | | |

8. මහාරයේ ප්‍රමාණය සහ ගෙවූ නොගෙවූ බව :————

* 9. කයිකූලියෙහි ප්‍රමාණය :————

10. විවාහය සිදුකරන ස්ථානය :————

11. විවාහය සිදුකරන දිනය හා වේලාව :————

12. ලියා පදිංචිකිරීමේ දිනය.————

13. 1වෙනි සාක්ෂිකරුගේ සම්පූර්ණ නම සහ පදිංචිය :————

14. 2වෙනි සාක්ෂිකරුගේ සම්පූර්ණ නම සහ පදිංචිය :————

15. " නිකා " චාරිත්‍රය සිදුකරන්නාගේ සම්පූර්ණ නම :————

16. අත්සන් :—

(1) මනාලයා :————.

† (2) මනාලියගේ වාලි :————.

(3) 1වෙනි සාක්ෂිකරු :————.

(4) 2වෙනි සාක්ෂිකරු :————.

(5) " නිකා " චාරිත්‍රය සිදුකරන්නා :————.

(6) ලේකම් :————.

* මෙම අංකයේ විස්තර ඇතුළත්කිරීම කැමතිනම් පමණෙකි.

† 47වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ විවාහයක් සිදුකිරීමට ක්වාසිතැන විසින් විශෙෂයෙන් බලය දුන්විටද නැතහොත් මනාලිය අයිති නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය අනුව " වාලි " කෙනෙකු අනවශ්‍ය විට ද මෙය අත්හැරීමට පිළිවන.

8. මහාරයේ ප්‍රමාණය සහ ගෙවූ නොගෙවූ බව :————

* 9. කයිකූලියෙහි ප්‍රමාණය :————

10. විවාහය සිදුකරන ස්ථානය :————

11. විවාහය සිදුකරන දිනය හා වේලාව :————

12. ලියා පදිංචිකිරීමේ දිනය.————

13. 1වෙනි සාක්ෂිකරුගේ සම්පූර්ණ නම සහ පදිංචිය :————

14. 2වෙනි සාක්ෂිකරුගේ සම්පූර්ණ නම සහ පදිංචිය :————

15. " නිකා " චාරිත්‍රය සිදුකරන්නාගේ සම්පූර්ණ නම :————

12. අත්සන් :—

මුද්දර

(1) මනාලයා :————.

† (2) මනාලියගේ වාලි :————.

(3) 1වෙනි සාක්ෂිකරු :————.

(4) 2වෙනි සාක්ෂිකරු :————.

(5) " නිකා " චාරිත්‍රය සිදුකරන්නා :————.

(6) ලේකම් :————.

* මෙම අංකයේ විස්තර ඇතුළත්කිරීම කැමතිනම් පමණෙකි.

† 47වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ විවාහයක් සිදුකිරීමට ක්වාසිතැන විසින් විශෙෂයෙන් බලය දුන් විට ද නැතහොත් මනාලිය අයිති නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය අනුව " වාලි " කෙනෙකු අනවශ්‍ය විට ද මෙය අත්හැරීමට පිළිවන.